## සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය - 2012

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2012 දෙසැම්බර් 31 දිනට සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දැන්වීම් පුවරු 100 ක පිරිවැය වූ රු. 3,287,500 ක් ස්ථාවර වත්කම් ලෙස ගිණුම් ගත නොකර එය වියදම් ලෙස කපා හැර තිබුණි.

(ආ) 2012 වර්ෂයේදී මිලදී ගෙන තිබූ රු. 188,888 ක් වටිනා පුස්තකාල පොත්, වත්කම් ලෙස ගිණුම්ගත නොකර වියදම් ලෙස කපා හැර තිබුණි .

(ඇ) සමාලෝචිත වර්ෂයට පෙර සිට පැවති පර්යේෂණ වාර්තා හා පුස්තකාල පොත් තොගයක්ද වටිනාකම ගණනය කොට, වත්කම් ගිණුම්වලට ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසානයේ ඉතිරිව තිබූ රු.3,858,584 ක් වටිනා තෙල් විසුරුම්කාරක ලීටර් 5,800 ක වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

### 1.2.2 නීති , රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2003 ජුනි 02 දිනැති අංක PED / 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | |
| (i) 5.2.1 ඡේදය | ඇස්තමේන්තුගත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර |

| | | |
|---|---|---|
| | | නොතිබුණි. |
| | (ii) 6.5.1 ඡේදය | කෙටුම්පත් වාර්ෂික වාර්තාව ගිණුම් සමඟ ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) | 2008 ජුනි 26 දිනැති අංක 13/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | අධිකාරියේ සාමාන්‍යාධිකාරී විසින් අවස්ථා 80 කදී කිලෝ මීටර් 5,890 ක දුර ප්‍රමාණයක් සංචිත වාහන භාවිතා කර තිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව සමාලෝචිත වර්ෂයෙ අධිකාරියේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.1,814,711 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂයේ රු.142,233 ක් වූ අතිරික්තය සමඟ සැසඳීමේදී මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,956,944 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් වර්ෂයේ මෙහෙයුම් වියදම් රු. මිලියන 29 කින් වැඩිවීම හේතුවී තිබුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

මූල්‍ය ප්‍රතිඵලය ඉකුත් වර්ෂයට වඩා සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 1.956 කින් පිරිහීම කෙරෙහි පහත සඳහන් විචලනයන් හේතු වී තිබුණි.

| විෂයය | 2012 | 2011 | විචලනය | |
|---|---|---|---|---|
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | ප්‍රතිශතය % |
| මුළු පුනරාවර්තන ප්‍රදාන | 79.902 | 53.327 | 26.575 | 49.83 |
| මෙහෙයුම් ආදායම් | 10.034 | 9.242 | 0.792 | 8.56 |
| මුළු ආදායම | 91.031 | 63.538 | 27.493 | 43.27 |
| මුළු මෙහෙයුම් වියදම් | 92.846 | 63.396 | 29.450 | 46.45 |

සමාලෝචිත වර්ෂයේ ආදායම ඉකුත් වර්ෂයේ ආදායම සමඟ සැසඳීමේදී සියයට 8.56 කින් වර්ධනය වී තිබුණත් ඊට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් වියදම ඉකුත් වර්ෂයේ වියදමට වඩා සියයට 43.45 කින් වැඩි වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ආදායම හා වියදම සැසඳීමේදී මෙහෙයුම් ආදායම් රු. මිලියන 82.812 කින් ඉක්මවා රු. මිලියන 92.846 ක මෙහෙයුම් වියදමක් දරා තිබුණි.

සමාලොචිත වර්ෂයේ ඌණතාවය රු. මිලියන 1.814 ක් දක්වා අඩු වීම කෙරෙහි මුළු පුනරාවර්තන ප්‍රදානය රු. මිලියන 72.902 ක් බලපා තිබුණි. සමාලෝචිත වර්ෂයෙ මෙහෙයුම් වියදම ඉකුත් වර්ෂයට වඩා වැඩි වීම කෙරෙහි වෙනත් දීමනා සියයට 1,577 කින්ද, ඉන්ධන වියදම සියයට 63 කින්ද සහ වාහන නඩත්තු වියදම සියයට 76 කින්ද වැඩිවීම බලපා තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියෙ 2012 වර්ෂයේ ක්‍රියාකාර් සැලැස්ම අනුව වර්ෂයේ මුළු ප්‍රතිපාදනය රු.36,400,000 ක් වු අතර වර්ෂයේ ප්‍රගති වාර්තා සටහන්වලට අනුව සත්‍ය වියදම රු:18,391,390 ක් විය. ඒ පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂයේ ක්‍රියාකාරකම් 12 ක් සඳහා සළසා තිබුණු රු. 6,100,000 ක මුළු ප්‍රතිපාදනයම ඉතිරිව තිබුණි.

(ආ) මුල් ක්‍රියාකාර් සැලැස්මේ ඇතුළත් නොවු ක්‍රියාකාරකම් 03 ක් සංශෝධනය කරන ලද ක්‍රියාකාර් සැලැස්මේ ඇතුළත් කර තිබු අතර එම ක්‍රියාකාරකම් තුනේම ප්‍රතිපාදනය වර්ෂය අවසානය වන විටත් ඉතිරිවී තිබුණි.

(ඇ) ක්‍රියාකාර් සැලැස්මේ ක්‍රියාකාරකම් 05 ක් සඳහා වූ ප්‍රතිපාදනයෙන් සියයට 75 කට වැඩියෙන් ඉතිරිවී තිබුණි.

(ඈ) 2012 වර්ෂය සඳහා පිළියෙල කරන ලද ක්‍රියාකාර් සැලැස්ම, 2012 දෙසැම්බර් මාසයේදී සංශෝධනය කර තිබුණි. මේ නිසා ක්‍රියාකාර් සැලැස්ම පාලන කාරකයක් ලෙස යොදාගෙන නොමැති බව නිරීක්ෂණය විය.

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

අවස්ථා 09 කදි ලබා ගත් රු. 90,500 ක අත්තිකාරම් මුදලම නැවත ආපසු පියවීම් කර තිබුණි. ඒ අනුව නිලධාරීන් විසින් අවශ්‍යතාවයකින් තොරව මුදල් අත රඳවාගෙන තිබුණු බව නිරීක්ෂණය විය. තවද ලබාගත් අත්තිකාරම් මුදලින් සියයට 50 කට වඩා නැවත ආපසු ගෙවා තිබුණු අවස්ථා 25 ක් විය. කළමනාකරණය විසින් රාජ්‍ය මුදල් අයථා පරිහරණයකින් තොරව යෙදවීම කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි.

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2010 නොවැම්බර් 13 දින නෞකාවකින් කොළඹ වරායෙදි සිදුවූ තෙල් විසිරීම නිසා ඇතිවූ සමුද්‍රීය දූෂණයට අදාලව 2008 අංක 35 දරන සුමුද්‍ර දූෂණය වැලැක්වීමේ පනතෙහි 26 (අ) වගන්තිය යටතේ වන්දි ලබාගැනීමට කටයුතු කිරීම මන්දගාමීව සිදුකරන බව නිරීක්ෂණය විය.

(ආ) විද්‍යාගාර පරීක්ෂණ වර්ග 12 ක් සිදුකිරීමට සැලැසුම් කර තිබුණද, පරීක්ෂණ වර්ග 05 ක් පමණක් සිදු කර තිබුණි. සිදුකරනු ලබන පරීක්ෂණ මත මුහුදු ජලය ඉතා අපිරිසිදු මට්ටමක පවතින බව නිරීක්ෂණය වුවද, දැනුවත් කරීමේ වැඩසටහන් හැර ඒ සම්බන්ධයෙන් වෙනත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) සමුද්‍ර දූෂණ වැලැක්වීමේ පනතේ අංක 34(1) වගන්තිය අනුව ජල දූෂණය සම්බන්ධව පුද්ගලයන් හා ආයතන වගකමට බැදෙන අතර පනතේ 54 (2)(ඇ) හා (ජ) වගන්ති අනුව නියෝග සකස් නොකිරීම නිසා පාරිසරික හානිය සඳහා වන්දි ලබාගැනීමට හෝ පරිසර හානි අවම කිරීමට පියවර ගැනීමට නොහැකි වීම නිසාත් විද්‍යාගාරය පිහිටුවීමේ අරමුණු ඉටුවී නොතිබුණි.

## 3.4 මතභේදයට තුඩු දෙන කරුණු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය විසින් 2011 වර්ෂයේ දැනුවත් කිරීමේ වැඩසටහනක් ලෙස ක්‍රියාත්මක කරන ලද දැන්වීම් පුවරු 150 ක් ස්ථාපිත කිරීම සඳහා රු. 4,931,250 කට අධ්‍යක්ෂ මණ්ඩලයේ පූර්ව අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ආ) තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශයට පටහැනිව දැන්වීම් පුවරු 100 ක් මිලදී ගැනීම නිසා රු.112,500 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. තවද දැන්වීම් පුවරු සවිකළ ස්ථාන සඳහන් සිතියමක් නොතිබු බැවින දැන්වීම් පුවරු නිසි සැලසුමකට අනුව ස්ථානගතකර තිබුණු බව තහවුරු කරගත නොහැකි විය.

## 3.5 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත වත්කම් නිශ්ක්‍රීයව පවතින බව නිරීක්ෂණය විය.

| භාණ්ඩය | ප්‍රමාණය | වටිනාකම | මිලදීගත් දිනය | නිෂ්ක්‍රීයව පැවති කාලය (2013.03.31 දිනට) |
|---|---|---|---|---|
| | | රු. | | |
| බෝට්ටු එන්ජම | 01 | 510,000 | 2012.04.27 | මාස 11 |
| ඩිංගි බෝට්ටුව | 01 | 672,000 | 2012.05.14 | මාස 10 |
| තට්ටු ඇඳන් | 03 | 29,550 | 2010.09.27 | අවු.02 මාස 06 |
| මෙට්ට (තනි) | 09 | 28,800 | 2010.09.27 | අවු. 02 මාස 06 |
| සාකච්ඡා මේස | 02 | 29,747 | 2011.04.28 | අවු 01.මාස 06 |
| Colony counter complete with PC software | 01 | 131,404 | 2010.12.28 | අවු 02 මාස 03 |
| Vaccum maniflod system with vaccum pump | 01 | 352,800 | 2010.12.28 | අවු 02. මාස 03 |

## 3.6 කාර්ය මණ්ඩල පරිපාලනය

2012 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ කාර්ය මණ්ඩලය පහත පරිදි විය.

| තනතුර | අනුමත සංඛ්‍යාව | තත්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 08 | 01 | 07 |
| තෘතියක මට්ටම | 12 | 10 | 02 |
| ද්විතීයක මට්ටම | 43 | 30 | 13 |
| ප්‍රාථමික මට්ටම | 82 | 61 | 21 |
| | 145 | 102 | 43 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සාමාන්‍යාධිකාරී ඇතුළු ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 7 ක් 2013 මාර්තු 31 දින වන විට ද පුරප්පාඩුව පැවතුණි. එම හේතුවෙන් අධිකාරියේ පරිපාලන කටයුතු අඩාල වී තිබුණි.

(ආ) අධිකාරියේ පුරප්පාඩුව පැවති කළමනාකරණ හා සහකාර කළමනාකරණ තනතුරු 06 ක් සඳහා බඳවාගැනීමට 2012 පෙබරවාරි මස අයදුම්පත් කැඳවා, ඉන් කළමනාකරු (නීති) තනතුර සඳහා පමණක් බඳවාගෙන තිබූ අතර ඉතිරි තනතුරුවල පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සහකාර කළමනාකරු (නීති) තනතුරේ කටයුතු කළ නිලධාරිනිය, කළමනාකරු (නීති) තනතුර සඳහා බාහිර අයදුම්කරුවෙකු ලෙස අයදුම් කර තිබූ අතර ඒ සඳහා තිබිය යුතු සුදුසුකම වූ සමුද්‍රීය නීතිය පිළිබඳ පශ්චාත් උපාධිය අධිකාරියෙන් ලද ශිෂ්‍යත්වයක් මත විදේශගත වී ලබාගත් උපාධියක් වූ නමුත් සම්මුඛ පරීක්ෂණයේදී ඒ සම්බන්ධයෙන් සැලකිලිමත් වී නොතිබුණි. උක්ත නිලධාරිනිය, රාජකාරි පැහැර හැරීම් සම්බන්ධයෙන් අවවාද කිරීම්වලට ලක්වූ හා පශ්චාත් උපාධිය සඳහා විදේශ ගතවීමේදී සිදුකරන ලද අක්‍රමිකතාවයන් හේතුවෙන් අසතුටුදායක සේවා කාලයක් ඇති අයෙකු වන අතර, බාහිර අයදුම්කරුවෙකු ලෙස අයදුම්කිරීමේදී එම කරුණු සම්බන්ධයෙන් නොසලකා හැර කළමනාකරු (නීති) තනතුර ලබාදී තිබුණි.

(ඈ) අධිකාරියේ සාමාන්‍යාධිකාරීවරයා 2013 මාර්තු 16 දින සේවයෙන් ඉවත්ව ගොස් ඇති අතර එදින සිට එම තනතුරෙහි වැඩ ආවරණය කිරීම සඳහා ද කළමනාකරු (නීති) නිලධාරිනිය පත් කර තිබුණි.

## 3.7 වාහන උපයෝජනය

2010 ඔක්තෝබර් 25 දින පරිසර අමාත්‍යාංශය වෙත මුදාහැර තිබූ අධිකාරිය සතු කැබ් රථයක් අමාත්‍යාංශයෙන් බැහැරව පෞද්ගලික ප්‍රයෝජනය සඳහා යොදාගෙන තිබී 2012 මැයි 18 දින අධිකාරිය වෙත ධාවනයට නුසුදුසු තත්ත්වයෙන් ආපසු භාරදී තිබුණි. මෙම වාහනය එදින සිට මාස 10 ක කාලයක් නිශ්කාර්යව පැවති බව නිරීක්ෂණය විය.

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 සංයුක්ත සැලැස්ම

#### 4.1.1 පනතේ අරමුණුවලට පටහැනිව සංයුක්ත සැලැස්ම පිළියෙල කර තිබීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2008 අංක 35 දරන සමුද්‍රීය පරිසර ආරක්ෂණ පනතේ අරමුණු ඉටුකර ගැනිම සඳහා සකස් කරන ලද 2012-2016 සංයුක්ත සැලැස්මෙහි ඇතුළත්, 2012 වර්ෂයේදී ළඟා කරගත යුතු වැඩසටහන් 38 ක් 2012 වාර්ෂික ක්‍රියාකාර සැලැස්ම තුළ අන්තර්ගත නොවීම නිසා එම ඉලක්ක ළඟාකර ගැනිමට නොහැකි වී තිබුණි.

(ආ) 2008 අංක 35 දරන සමුද්‍ර දුෂණය වැළැක්වීමේ පනත අනුව සමුද්‍රීය පරිසර සභාව පිහිටුවීමට වාර්තාවේ දිනය දක්වා කටයුතු කර නොතිබුණි.

#### 4.1.2 පනතේ අරමුණු ඉටු නොවීම

2008 අංක 35 දරන සමුද්‍ර දුෂණය වැළැක්වීමේ පනතේ 51 (1) මගින් නියම කරන ලද නියෝගයන් 11 ක සම්බන්ධ නීති හා විධිවිධාන කෙටුම්පත් සකස් කර ගැසට් කර පනතේ අරමුණු ඉටුකර ගැනිමට අධිකාරිය කටයුතු කර නොතිබුණි.

### 4.2 අයවැය ලේඛනයමය පාලනය

සමාලෝචිත වර්ෂයේ අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් විෂයයන් 20 ක සියයට 54 සිට සියයට 99 දක්වා වෙනස්කම් පැවති බව නිරීක්ෂණය විය. මේ අනුව අයවැය ලේඛනය පාලන කාරයක් ලෙස යොදාගෙන නොමැති බව නිරීක්ෂණය විය.

### 4.3 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2011 වර්ෂයේ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 4.4 පාරිසරික හා සමාජ වගකීම ඉටු කිරීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2007 වර්ෂයේ සිට වරායෙන් පිටත පානදුර ප්‍රදේශය අසල මුහුදු ප්‍රදේශයෙහි නැංගුරම්ලා තිබූ නැවක තෙල් කාන්දුවීමෙන් සමුද්‍ර පරිසර දූෂණයක් සිදු වීමේ අවදානමක් ඇති බව දන්වා තිබූ අතර අධිකරණය විසින් සමුද්‍රීය පරිසර දූෂණය වැළැක්වීම සඳහා ඕනෑම පියවරක් ගැනීමට අවසර දී තිබියදී අධිකාරිය මේ සම්බන්ධයෙන් කටයුතු නොකිරීම හේතුකොට ගෙන මෙම නෞකාව පානදුර මුහුදේ ගිලීමෙන් පරිසර හානියක් සිදු වී තිබුණි. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් ආපදාවක් ලෙස වාර්තා කර තිබුණද මෙම කාලය තුළ අධිකාරිය විසින් නැව තුළ ඇති තෙල් ප්‍රමාණය නිවැරදිව ගණනය කර, තාක්ෂණික වාර්තාවක් හෝ ලබා ගෙන නොතිබුණි.

(ආ) සමුද්‍ර පරිසර දූෂණ අවදානම අඩුකර ගැනීම සඳහා නැව තුළ ඇති තෙල් ප්‍රමාණය පිටතට ගැනීම සඳහා ටෙන්ඩර් මඟින් මිල කැඳවීම් කර තිබුණද ටෙන්ඩර් පත්‍රිකාවලට අනුව නැව තුළ ඇති මෙට්‍රික් ටොන් 800 ක තෙල් ප්‍රමාණය ඉවත් කිරීමට මිල ගණන් කැඳවා තිබුණු නමුදු සුදුසු සැපයුම්කරුවකු තෝරාගත නොහැකිවූ නිසා එම කාර්යය ඉටුකර නොතිබුණි.

(ඇ) සමුද්‍ර පරිසර දූෂණ වැළැක්වීමේ පනතේ 6 (ආ) හා (ඇ) වගන්ති අනුව ශ්‍රී ලංකා ජල තීරයේ හෝ වෙනත් යම් සමුද්‍ර කලාපවල හෝ ශ්‍රී ලංකාවේ පෙර වෙරළ සහ වෙරළ කලාපය තුළ නැව් ආශ්‍රිත කාර්යයන්ගෙන් දූෂණය වීම වැළැක්වීම, අඩු කිරීම, පාලනය කිරීමේ සහ කළමනාකරණය කිරීමේ කාර්යයන් සඳහා වූ යෝජනා ක්‍රමයන් සකස් කිරීම හා ක්‍රියාවේ යෙදවීම කළ යුතු වුවද එවැනි සැලැස්මක් අධිකාරිය සතුව නොතිබුණි.

(ඈ) අධිකාරිය විසින් රු.11,874,652 ක වියදමක් නැවෙන් සිදුවූ තෙල් කාන්දුවීම නිසා පරිසර හානිය අවම කිරීම සඳහා වැය කර තිබුණි.

(ඉ) පනතේ 7 (ඇ) වගන්තිය අනුව දූෂණය වැළැක්වීමේ කාර්යය සඳහා ශ්‍රී ලංකා වෙරළ තීරය තුළ සහ වෙනත් යම් සමුද්‍ර කලාප හෝ ශ්‍රී ලංකාවේ පෙර වෙරළ සහ වෙරළ කලාප තුළ පවත්වාගෙන යන මුහුදු තෙල් ප්‍රවාහන කටයුතු හා බංකර්න් මෙහෙයුම් සියල්ල පාලනය කිරීම කළහැකි වුවද අධිකාරිය විසින් එවැනි කටයුතු පාලනය කිරීමක් සිදුකර නොතිබුණි.

(ඊ) සමුද්‍රීය පරිසර ආරක්ෂණ පනතේ දූෂණය වැළැක්වීම සම්බන්ධ අපරාධ වගකීම viii කොටසේ 26 වන වගන්තියට අනුව යම් නැවකින් ශ්‍රී ලංකා ජල තීරයට හෝ වෙනත් යම් සමුද්‍රීය කලාපයකට දූෂක ද්‍රව්‍යයන් පිටකරනු ලැබුවහොත් නැතහොත් පිට වුවහොත් මේ පනතේ විධිවිධානවලට යටත්ව වරදකරු කරනු ලැබූ විට රු.මිලියන 4 කට නොඅඩු වන්නාවූ සහ රු. මිලියන15 නොවැඩි දඩයකට යටත් විය යුතුය.

පනතේ යථෝක්ත දූෂණයන් වැළැක්වීම සම්බන්ධ අපරාධ වගකීම සඳහා අවශ්‍ය නීති රීති සකස් කිරීම, කෙටුම්පත් සහ ගැසට් පත් සකස් කිරීමට අධිකාරිය කටයුතු කර නොතිබුණි.

(උ) මේ හේතූන් නිසා සමුද්‍ර දූෂණ සම්බන්ධ වරදකරුවන්ට අදාලව නෛතික ක්‍රියාමාර්ග ගැනීම හා දණ්ඩනයන්ට යටත් කිරීම මගින් පනතේ අරමුණු අනුව සමුද්‍ර දූෂණය වලක්වාලීමට අවශ්‍ය පියවර ගැනීමට නොහැකි වී තිබුණි.

(ඌ) සමුද්‍ර දූෂණ සම්බන්ධව විවිධ කර්මාන්ත සහ පුද්ගලයින්ට එරෙහිව ඉදිරිපත් වන්නා වූ මහජන පැමිණිලි සම්බන්ධ විධිමත් මූලික හා අවසාන පරීක්ෂණයන් පවත්වා නොතිබුණි. එමෙන්ම ඔවුනට සමුද්‍ර දූෂණය වැළැක්වීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට, අවශ්‍ය කටයුතු කිරීම දන්වා සිටීම පමණක් සිදුකර ඇති අතර ඒ සම්බන්ධ පසු විමර්ශණ කටයුතු සිදුකර සමුද්‍ර දූෂණය වැළැක්වීමට පියවර ගෙන නොතිබුණි.

## 5. පද්ධති හා පාලනයන්

විගණනයේ දී නිරීක්ෂණය වූ පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන්හි අඩුපාඩු වරින් වර අධිකාරියේ සභාපතිවරයාගේ විශේෂ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුව ඇත.

(අ) ගිණුම්කරණය

(ආ) කාර්ය මණ්ඩල පරිපාලනය

(ඇ) වත්කම් පාලනය

(ඈ) අයවැය පාලනය

(ඉ) වාහන පාලනය